
# එක්සත් රාජධානියේ කිතු බැතිමත්තු ප්‍රථමවරට දේවමෙහෙයක් පවත්වා රණවිරුවන්ට ආශීර්වාදකරති

**එ**ක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රීලාංකික ක්‍රිස්තු භක්තික දේශමාමක සිංහල පිරිස් විසින් ගිය මස 29 වෙනි දින ලන්ඩන යේ විල්ස්ඩන්හි ශාන්ත මග්දලායේ මරියා දේවස්ථාන යට එක්රැස්ව ශ්‍රී ලංකා දේශය ත්‍රස්ත වාදී සතුරන්ගෙන් මුදාගැන්මට අභීතව සටන්කරන රණවිරු වන්ට දේවාශීර්වාද ප්‍රාර්ථනාකරන එසේම, රට වෙනුවෙන් සිය ජීවිත පරිත්‍යාග කළ සියලු දේශ-ප්‍රේමීන් සිහිකරන විශේෂ දේව පූජාවක් පවත්වන ලදී.



ටෝනි ද අල්විස් (වමේ) සහ සුනිල් පොන්වීර පියතුමන්ලා දේවමෙහෙය ඉටුකරයි



දේව මෙහෙයට සහභාගි වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතරින් කිංස්බරි විහාරයේ පූජ්‍ය හාන්දුපැල්පොල මහින්ද හිමියෝ බෞද්ධ සාහිත්‍යයෙන් කථාවක් ගෙන හැරපාමින් සුහදත්වයෙන් ජීවත්වීමේ අගය පැහැදිලි කළහ.



**Photographs Sisira Maddumage**

කතෝලික සහ අනෙක් ක්‍රිස්තියානි නිකායවලට අයත් ලාංකිකයන්ද, බෞද්ධ පිරිසද, ලන්ඩනයේ විහාරස්ථාන වලින් සහ බර්මිංහැම් නගරයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලාද මෙම විශේෂ දේව මෙහෙය සඳහා දේවස්ථානයට පැමිණ සිටියහ.

ශ්‍රීලංකාවේ රණවිරුවන් වෙනුවෙන් මෙවැනි දේව මෙහෙයක් එක්සත් රාජධානියේ පැවැත්වූ ප්‍රථම වතාව මෙය වන්නේය. මේ සියල්ලේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ පූජ්‍ය ටෝනි ද අල්විස් පියතුමා සහ පූජ්‍ය සුනිල් පොන්වීර පියතුමාද සමග ලන්ඩනයේ දේශමාමක ක්‍රිස්තු භක්තිකයින්ය. එදින රැස්ව සිටි විශාල පිරිස අතර ශ්‍රී ලංකා මහකොමසාරිස්තුමා ප්‍රමුඛ මහකොමසාරිස් කාර්යාලයේ නිලධාරි මඩුල්ලද වූහ.

සිය දේශනයේදී ටෝනි ද අල්විස් පියතුමා මෙසේ කීවේය. “ අද අප රැස්ව සිටින්නේ අප මව්බිමේ අඛණ්ඩතාවය සුරකින ඒ වීරෝදාර හමුදාවන්ට ආශීර්වාද කරන්නටත්, රට වෙනුවෙන් තම ජීවිත පිදූ ඒ උදාර පිරිස් අභිමානයෙන් යුතුව සිහිකරන්නටත්. එසේම අපේ දේශය මුදාගන්නට නායකත්වය දෙන සැමටද ආශීර්වාදකර දෙව්පිහිට පතන්නටත්. අපේ ජාතිය ආගම් වශයෙන් බෙදී සිටියොත් අපට එක්සත්ව මේ ගමන යන්න බැරිවෙනවා. එතකොට මේ රණ ශූරයින් භූමියේ හෙලූ ලේ වල ප්‍රයෝජනයක් නැතිවෙනවා. ඒ නිසා අප සමගිව එකට යායුතුයි. එවිටයි අපේ රටේ අනාගතය සුබදායක වන්නෙ. ඒ සමගම කියන්න කැමතියි, මෙතෙක් පැවති දුර්මතයක් නම් ක්‍රිස්තු භක්තිකයන් දේශප්‍රේමී නැතැයි කීම. එය වැරදි අදහසක්. ඊට හේතුව අපේ සමහර ක්‍රිස්තියානි ආගමික නායකයින්ගේ නොමනා ක්‍රියාකලාප. ඒකයි මෙවැනි දේව මෙහෙයකින් අප පෙන්වන්නෙ අප හැමවිටම අපේ මාතෘභූමිය රකින රණවිරුවන් සමග බව.”

පූජ්‍ය සුනිල් පොන්වීර පියතුමා සිය දේශනයේදී **ලංකාවිත්ති** පුවත් පතේ පළවූ රණවිරුවන් වෙනුවෙන් ලියැවුණු කවි දෙකක් උපුටා දක්වමින් ශ්‍රීලංකාවේ රණවිරුවන් කොපමණ කැපවීමකින් ක්‍රියාකරන්නේද යන්න පැහැදිලි කළේය. එසේම එතුමා කීයේ



බලකායේ ඇඳුමින් සැරසී සිටි සිංහල දැරියක් වන කේසරා උස්හෙට්ටිගේ දේවස්ථානයේ කථනයන්ට සවන් දෙමින්

ත්‍රස්තවාදය ශ්‍රීලංකා භූමිතලයෙන් සදහටම තුරන්ව ගොස් තව අවුරුදු 2500 ක් කල් අපේ දේශය ධර්මද්වීපයක්ම වේවායි ප්‍රාර්ථනා කරන බව ය. යුද්ධය නිමාකොට යන ඉදිරිගමනේදී කිතු බැතිමතුන් අනෙක් සියළු ආගම් සමග අත්වැල් බැඳගෙන රට සෞභාග්‍යය කරා ගෙන යාමට කැපවන බව ය.

රැස්ව සිටි බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතුරින් පූජ්‍ය ආචාර්ය හාන්දුපැල්පොල මහින්ද නාහිමියන් කතාකරමින් පැවසුවේ කිතුබැතිමතුන් දේශප්‍රේමී නොවන්නේයයි කීමවැරදි බවත් එදින එවැනි දේවමෙහෙයක් පැවැත්වූ දේශප්‍රේමී පියතුමන් ලාගේ පියවරට මුළුමහත් දේශයේම ප්‍රශංසාව හිමිවිය යුතු බවත් ය.

ශ්‍රීලංකා මහකොමසාරිස් නිහාල් ජයසිහ මහතා සිය කතාවේදී පියතුමන්ලා ඇතුළු ලන්ඩනයේ කිතු බැතිමතුන්ට ස්තුති කළේ එවැනි දේව මෙහෙයක් පැවැත්වීම විවිධ ආගම් අතර ආගමික සමගියක් ඇතිවීමට හේතුවන බව පැවසීමෙනි.

දේවස්ථානයේ ගීතිකා මඩුල්ල ඉතා කර්ණ රසායන ගීතිකා ගැයූ අතර, ශ්‍රීලංකා ජාතික ගීය ගැයීමෙන් දේවමෙහෙය නිමාවීය.

**වෙනුර**



# No limit to love and anger

## ( A True story recently happened in America )

While a man was polishing his new car in the morning, his 4-year-old son picked stones and scratched lines on the side of the car.

When saw it, in anger, the man took the child's hand and hit it many times, not realizing he was using a wrench.

At the hospital, the child lost all his fingers due to multiple fractures. Doctors said child's fingers would not be the same again.

With painful eyes the son asked his dad. “ Dad when will my fingers grow back? ”

Man was so hurt and speechless. He went back to car and kicked it a lot of times.

Devastated by his own actions... sitting in front of that car he looked at the scratches, child had written **' LOVE YOU DAD'.**

The next day that man committed suicide . . .

Anger and Love has no limits. Both sometimes go off the rails causing harm. So let the river of life flow in limits so that this fresh water stream is never scattered.

♦ **Siri Herath - Machida Shi, Tokyo, Japan**

# ආදරයට හෝ කෝපයට සීමාවක් නැත

## මෑතක ඇමරිකාවේ සිදුව ඇති සත්‍ය කතාවකි

දිනක් එක් මිනිසෙක් තම නිවසේ ඉදිරිපිට ඔහුගේ අළුත්ම මෝටර් රථය ඔපදමමින් සිටියේය. ඔහුගේ සිව් හැවිරිදි පුතා කාර් එක ළඟම ඉඳගෙන පියාට නොපෙනෙන්නට ගල්කැට වගයකින් එම රථයේ එක් පැත්තක සූරන්නට වීය.

පුතා කරමින් සිටි ක්‍රියාව දුටු මිනිසාට ඉමහත් කේන්තියක් ආවේය.

“ මේ අළුත්ම කාර් එක තියෙන්නෙ උඹට හූරන්න නොවෙයි.”

ඔහු කුඩා ළමයා පසෙකට ඇදගෙන ගොස් ළමයාගේ අත අඹරවමින් අතට දැඩිව පහර දුන්නේය. තමා එපමණ තදින් දරුවාගේ අත අඹරන බවක් එවෙලේ ඔහුට තේරුණේ නැත.

වේදනාවෙන් කෑගසන දරුවා පියා විසින්ම රෝහළ වෙත ගෙනයන ලදී.

ළමයා ගේ අතේ ඇඟිලි සියල්ලම යළිත් යථා තත්වයට පත් කළ නොහැකි ලෙස කැඩී බිඳී ගොස් ඇති බව රෝහලේ දී දොස්තර වරු කීහ.

දරුවා ඉතා වේදනාවෙන් කෙඳිරිගාමින් තමා ළඟ වටවී බලා සිටි පියාගෙන් ඇසුවේ තාත්තේ මගේ ඇඟිලි ආයිත් හොඳ වෙන්නෙ කවද්ද? යනුවෙනි.

මිනිසාට කතාකරන්නට වචන නැතිවිය. ඔහු ආපසු තම මෝටර් රථය වෙත ගොස් කළේ ඊට නොනවත්වාම පයින් පහර දීගෙන යෑමයි.

තමා නිසා පුතාට සිදුවූ දේ ගැන කම්පා වෙමින් හා හඬමින් මඳකින් ඔහු මෝටර් රථයේ ළමයා ගලකින් සූරන ලද තැන දිහා බැලුවේය.

ළමයා එහි කුරුටු ගා තිබුණේ “ මම තාත්තට ආදරෙයි ” යන වචනය.

ඒ මිනිසා පසුදා දිවිනසාගත්තේ ය.

ආදරයට සහ කෝපයට කිසිත් සීමාවක් නැත. ඒ දෙකම පාලනය කරගැන්ම යහපත්ය. ජීවිතය නමැති ගංගාව යම් යම් ප්‍රමාණයන්ට අනුව පාලනය කරගනිමින් ගලායන්නට සැලැස්විය යුතුවෙයි. එවිට එය අයාලේ පිටාර ගලා ගොස් විනාසයක් නොකරන්නේය.

♦ **සිරි හේරත් - ටෝකියෝ - ජපානය**

# Sri Lanka 'joker' jibe angers India

The Indian government has protested to Sri Lanka over a statement made by the Sri Lankan army commander who described some Indian politicians as "jokers".

In an interview with a state-run newspaper, Lt Gen Sarath Fonseka said that the Indian government would not listen to Tamil Nadu "jokers".

“ If the Tamil Tigers are wiped out, those political jokers... who sympathise with them will most probably lose their incomes from them,” Lt Gen Fonseka was quoted by the Sunday Observer as saying.

He was commenting on the recent protests in Tamil Nadu against Sri Lanka's military offensive in the north of Sri Lanka.